# ශ්‍රී පාලි මණ්ඩපය
# කොළඹ විශ්ව විද්‍යාලය

<u>ශිෂ්‍ය දුක්ගැනවිලි පිළිබඳ පැමිණිලි කිරීම සඳහා වූ ආකෘති පත්‍රය</u>

ශ්‍රී පාලි මණ්ඩපයේ සේවක සහ ශිෂ්‍ය දුක්ගැනවිලි පිළිබඳ විමසා බැලීමට කොළඹ විශ්ව විද්‍යාලයේ පාලක සභාව විසින් කමිටු දෙකක් (2) පත්කර ඇත.

ඔබේ දුක්ගැනවිල්ල හැකි තරම් සාරාංශ කර මේ සමඟ ඉදිරිපත් කර ඇති ආකෘති පත්‍රය අනුව සකස් කර ලියාපදිංචි තැපැලෙන් මතු දැක්වෙන ලිපිනයට ලැබීමට සලස්වන ලෙස ඉල්ලමි.

ලිපිනය - ලේඛකාධිකාරී, කොළඹ විශ්ව විද්‍යාලය,නො.94 ,කුමාරතුංග මුනිදාස මාවත,කොළඹ 03 .

දුක්ගැනවිල්ල ඉදිරිපත් කිරීමේදී පහත සඳහන් පරිදි කටයුතු කරන ලෙස දන්වමි.

1) ඔබගේ පැමිණිල්ල ලියුම් කවරයක බහා සීල් කරන්න.එම ලියුම් කවරයේ මතු දැක්වෙන දෑ සඳහන් කරන්න. ශිෂ්‍ය දුක් ගැනවිලි පිළිබඳ කමිටුවේ සභාපති තුමා, ශ්‍රී පාලි මණ්ඩපය,කොළඹ විශ්ව විද්‍යාලය.

2) ඉහත ලියුම් කවරය සුරකිව තවත් ලියුම් කවරයකට දමන්න.එම ලියුම් කවරයේ පහල වම්පස ඔබේ ලිපිනයද, දකුණුපස ඉහත සඳහන් කල ලේඛකාධිකාරී තුමාගේ ලිපිනයද ලියන්න. ලියුම් කවරයේ වම්පස උඩ කොටසේ "ශ්‍රී පාලි මණ්ඩපයේ ශිෂ්‍ය දුක් ගැනවිලි" යන්න සඳහන් කරන්න.

3) ඔබ සතුව ඇති තහවුරු කිරීමේ ලේඛන මෙම කවරයට ඇතුළු කිරීමට නොහැකිනම් දුක්ගැනවිලි පිළිබඳ කරන විමසීමේදී එකී ලේඛන පිටපත් දුක් ගැනවිලි කමිටුවට ඉදිරිපත් කල හැකිය.

4) ඔබගේ පැමිණිලි කිරීම පිළිබඳව ඔබට අපැහැදිලි යමක් ඇත්නම් ඒ සඳහා සඳුදා සහ සිකුරාදා දිනවල ප.ව.1.00 සිට 4.00 දක්වා දුරකථන අංක 2553644 මඟින් □□□□ □□□□□ □□□□□□□□□□ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ අනධ්‍යයන ආයතන, විමසා ලබා ගත හැකිය.

5) දුක්ගැනවිලි පිළිබඳ කමිටුවේ සාමාජිකයින් කොළඹ විශ්ව විද්‍යාලයට හෝ ශ්‍රී පාලි මණ්ඩපයට කිසිම අයුරකින් සම්බන්ධතාවයක් පවතින අය නොවේ.

6) ඔබ සපයන්නාවූ කිසිම තොරතුරක් තුන් වන පාර්ශවයකට නොලැබෙන බවට දුක්ගැනවිලි කමිටුව සහතික කර සිටී. එම කමිටුව ඔබගේ දුක් ගැනවිල්ල විසඳීමට කල හැකි යෝජනා කොළඹ විශ්ව විද්‍යාලය වෙත ඉදිරිපත් කරනු ඇත.

කේ.ඒ.එස්.එඩ්වඩ්
ලේඛකාධිකාරී

## ශ්‍රී පාලි මණ්ඩපය
## කොළඹ විශ්ව විද්‍යාලය

### ශිෂ්‍ය දුක්ගැනවිලි පිළිබඳ පැමිණිලි කිරීම සඳහා වූ ආකෘති පත්‍රය

1. නම :

2. අධ්‍යයන පාඨමාලාව :

3.අධ්‍යයන වර්ෂය :

4. තැපැල් ලිපිනය (පුද්ගලික) :

5. දුරකථන අංකය :

6. විද්‍යුත් තැපැල් ලිපිනය :

7. පැමිණිල්ලේ මාතෘකාව :

8. දුක්ගැනවිල්ලේ සැකැස්ම :

I. කිනම් කාරණාවක් උදෙසාද යන්න සැකෙවින් ලියන්න

II. මෙම දුක්ගැනවිල්ල තුල ඔබට සිදුවී ඇති අසාධාරණය/ මානසික ගැටළුව පිළිබඳව සැකෙවින් ලියන්න

III. ඔබේ පැමිණිල්ලට අදාල සාක්ෂි පිටපත් පිළිවෙලින් අංක යොදා ඉදිරිපත් කරන්න.

a)

b)

c)

VI. ඔබේ දුක්ගැනවිල්ල සමනය කර ගැනීම සඳහා ඔබ විසින් කරනු ලබන යෝජනා සඳහන් කරන්න.

a)

b)

c)

VII. ඔබේ දුක් ගැනවිල්ලට අදාළ තහවුරු කිරීමේ ලේඛන a, b, c...ආදී වශයෙන් නම් කර මීට අමුණනන්න. අමුණන ලද ලිපි ලේඛන මොනවද යන්න අදාළ අංකය සමඟ පහත සටහන් කරන්න.

a)

b)

c)

(මෙහි ඇති ඉඩ ඔබට ප්‍රමාණවත් නොමැති නම් වෙනම දිගු විස්තර මීට යා කල හැකියි)

මෙම පැමිණිල්ල සාවද්‍ය නොවූවක් බවත් වෙනත් පාර්ශවයක බලකිරීමක් මත සිදු නොකරන ලද්දක් බවත් සහතික කරමි.

.........................................

අත්සන

දිනය :